# හමුදා ප්‍රධානියාගේ විරෝධය පිටුපස ''ජාත්‍යන්තර ප්‍රජාව'', නේපාල අගමැති ඉල්ලා අස්වෙති

නේපාල අගමැති ප්‍රචණ්ඩා (පුෂ්ප කමල් දහාල්), ආණ්ඩුවේ අධිකාරයට ඇඟිලි ගැසීමට නේපාල හමුදාවේ ප්‍රධානියාට තවදුරටත් ඉඩහරිනවාද නැද්ද යන, වැදගත් ආරවුල නිසා 2009 මැයි 04 වෙනිදා සිය ධූරයෙන් ඉල්ලා අස්විය.

2006 දී දස වසරක මහජන යුද්ධය අවසාන කරන්ට උවමනා සාම එකඟතාවයට සහ ව්‍යවස්ථාව අතරතුර කාලයේදී විරෝධයත්, සිවිල් ආණ්ඩුවට දිගටම හිතාමතා කුපිත කරවීම් කළ නිසා, හමුදාවේ ප්‍රධානියාවූ රුක්මන්ගඩ් කටාවාල් නෙරපා තිබුණි. නමුත් ජනාධිපත් රාම් බරාම් යාදව්, ප්‍රචණ්ඩාගේ තීරණය ප්‍රතික්ෂේප කර, හමුදාවේ ප්‍රධානියා වශයෙන් ඔහුගේ නිලයේ තබාගන්ට නියෝග දුණි. (ජෙනරල් කටාවාල් දැනටමත් ඔහුව නෙරපා දැමීමට දන්වා තිබුණු රජයේ ලිපිය බාරගැනීම ප්‍රතික්ෂේප කර ඇත.) ඔහු ආරක්ෂක ඇමැතිවරයාගේ තීරණය ප්‍රතික්ෂේප කළද, රාම් බහදූර් යාපා ''එකඟතාවයක් ඇතිකරගන්නා තුරු'' කටාවාල්ගේ තනතුර ගෙනයන්ට අතරතුර කාලයේ නේපාල හමුදාවේ අණදෙන්නා වශයෙන් ඔහුව පත්කරන්නට කල්පනාකර තිබුණි.

ඊළඟ දිනයේ ඉල්ලා අස්වීමේ කථාවෙන්, ''සාම වැඩ පිළිවෙල සහ මෙම ළදරු ප්‍රජාතන්ත්‍රවාදයට පහරදීමක්'' සහ ජනාධිපතිගේ මැදිහත්වීම ''නීති විරෝධී සහ ව්‍යවස්ථානුකූල නොවන බව'' දැනුම් දුණි. ''ප්‍රතිගාමී බලවේග සහ විදේශීය මූලයන්ට යටත් වෙමින් බලයේ සිටිනවාට වඩා ඉක්මනින් ආණ්ඩුවෙන් ඉවත්වෙමි'' ඔහු කීය.

ජනාධිපති යාදව් ඔහුගේ ඉල්ලා අස්වීම භාරගෙන අලුත් ආණ්ඩුවක් ඇති කරගන්නා තුරු භාරකාර අගමැති වශයෙන් දිගටම සිටිනවාදැයි ඔහුගෙන් ඇසීය. මේ අර්බුදයෙන් ගොඩ එන ආකාරය සාකච්ඡා කිරීමට සියලු පක්ෂවල රැස්වීමක් ජනාධිපති කැඳව්වේය. සේනාධිපති කලින් සිටි තනතුරට පත් කිරීම ගැන සමාව ඉල්ලීමට ජනාධිපති ඉදිරියට එන තුරු සියලුම පාර්ලිමේන්තු කටයුතු වලට අවහිර කරන බවත් වීදිවල විරෝධතා සංවිධානය කරන බවටත් එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ප්‍රතිඋත්තර දුණි.

ඔහුගේ පක්ෂය අලුත් ආණ්ඩුවට එකතුවෙනවාද නැද්දැයි යන්න වාර්තාකරුවෙකු විමසූවිට ''නෙරපූ හමුදා ප්‍රධානියා නැවත පත් කිරීමට හා තෝරාගත් ආණ්ඩුවට විරුද්ධව නවදිල්ලියෙන් කෙලින්ම සේනාධිපතිට නියෝග කර ඇති බවත් එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂයේ නායකයෙකු හා මුදල් ඇමති වන ''බාබුරාම් භට්රායි'' කීවේය. ''ජනාධිපති (ව්‍යවස්ථා විරෝධී තීරණයක් බව බාර ගත්තොත්) එවිට පමණක් ආණ්ඩුවට එකතුවීම පිළිබඳව සිතන්නට පුලුවනි. ප්‍රජාතන්ත්‍රවාදී විරෝධී පක්ෂයට විරුද්ධව බහුජනතාව සටන් කරන්නට වීදිවලට යාවි.'' (''The Hindu'' මැයි 04). ප්‍රජාතන්ත්‍ර විරෝධී පක්ෂය නේපාල කොංග්‍රස් පක්ෂයයි.

ආණ්ඩුව තුලවූ අනිත් ප්‍රධාන පක්ෂය වූ එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂය ඉවත් වීමෙන් පසු එක්සත් මාක්ස් ලෙනින්වාදි නේපාල කොමියුනිස්ට් පක්ෂය කුඩා පක්ෂයක් සමග, ප්‍රචණ්ඩා සේනාධිපති ඉවත් කිරීමට විරුද්ධව කැබිනට්ටුවෙන් ඉවත් විය. ප්‍රචණ්ඩා ඉල්ලා අස්වූයේ නැතිනම් පවා එයට පවතින්නට නොහැකි බවත්, එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂයට පාර්ලිමේන්තුව තුල විශ්වාසය නොමැතිකමට මුහුණ දීම මෙය අදහස් කරයි. නමුත් මෙය පාර්ලිමේන්තු දබරයක් නොව මේ ගැටුමේ වඩාත් අවදානම, මූලික ප්‍රකාශන අඳුරු නොකළ යුතුය.

ප්‍රචණ්ඩා ඔහුගේ ඉල්ලා අස්වීමේ කථාවේදි ඉදිරිපත් කළ පරිදි හමුදාවේ ක්‍රියාපිලිවෙල සහ වඩාත්ම කේන්ද්‍රගතවූ පැවැත්මට, හමුදාව සංවිධානාත්මක හෝ දුර්වල නොකර ඔහුගේ ආණ්ඩුව ස්ථිරව තබාගන්ට නිලයක් නිර්මාණය වුණි. මෙය නිලයේ සමාන්තර බලයයි. කිසියම් රාජ්‍ය බලයක මධ්‍යම කුළුන සන්නද්ධ බලවේග වෙති. නිල පැවැතීමේ කාරණයක් නොවේ. ජනගහන අනුපාතයට අනුව දකුණු ආසියාවේ විශාලතම හමුදාවලින් එකක් වන නේපාලය තුලද මෙම ප්‍රධාන සත්‍යයට විශේෂයෙන්ම සුදුසුය. ඉන්දියාව සමග කිට්ටුවෙන් වැඩකරන අතර ජනතාවට විරුද්ධව බලාත්කාරය ඔස්සේ, බලය තුල පාලක පංති තබා ගැනීම මේ නිරුවත් වැඩපිලිවෙල සහ විවෘත එකක්ව සමාජය තුල විශේෂයෙන් වැදගත් ව්‍යවස්ථාදායක කටයුත්ත හමුදාව රඟපා ඇත.

## මෙය සිද්ධවුණේ කොහොමද?

අවබෝධාත්මක සාමගිවිසුම කැරලිකරුවෝ අනුගමනය කිරීම, රදළ ක්‍රමය අහෝසි කිරීමෙන් සහ අවසානයේදී 2008 අගෝස්තුවේ ආණ්ඩුවක් ඇති කිරීමට පැවැත්වූ ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභා මැතිවරණයේදී ඔවුහු පුදුමාකාර ජයක් ලැබුවේය. නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) (එය මූලිකව කැඩී වෙන්වීමේ සිට, එක්සත් මධ්‍යස්ථානය (මාෂල්) සමග නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) මිශ්‍ර වෙන විට පක්ෂය එහි වර්තමාන නම මේ අවුරුද්දේ මුලදී යෝජනා කරගත්තේය. මාෂල්, මහජන යුද්ධයට සහ මාඕවාදයේ සංකල්පයට විරුද්ධව සිට ඇත.) මැතිවරණයට සම්බන්ධවූ අනිකුත් ප්‍රධාන පක්ෂ දෙකට වඩා විශාල ඡන්ද ප්‍රමාණයක් දිනාගෙන තිබුණු කාරණය නොසලකා එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂයට නව ආණ්ඩුවේ නායකත්වය ගෙන යෑමට නැවත සන්නද්ධ හමුදාවන්ගේ අණදෙන ප්‍රධානියා වශයෙන් සහ රාජ්‍යයේ ප්‍රධානියා සිටියයුතු ජනාධිපති තනතුරක් නිර්මාණය කරන්ට ඉඩදෙන්ට එම පක්ෂය බලකර සිටියෝය. එම වෙලාවේ ජනාධිපති නිලය, ප්‍රධාන චාරිත්‍රයක් ලෙස අඟවා සිටියේය. නමුත් ජනාධිපතිගේ බලය

හමුවේ නේපාල හමුදාවේ නීත්‍යානුකූල බව ප්‍රයෝජනයට ගන්නාවිට, ජනාධිපතිගේ බලය ඉතා බලවත්ව නැවත නැගී සිටියි.

සේනාධිපති කටාවාල් ඔහුගේ මුලු ජීවිතයම විප්ලවය පාගා දැමීමට, බාරගෙන තිබුණු මිනිසෙක් විය. ඔහු ඉන්දියාවේ සහ පාකිස්තානයේ හමුදා පාසැල්වල මෙන්ම, එක්සත් රාජධානියේ හමුදා අණදීමේ පුහුණුවද, කඳුකර කැරලි මර්ධනය සහ එක්සත් ජනපදයේ විශේෂ බලඇණි (ග්‍රීන් බැරට්)(Green Berets) පුහුණු වීම් තුලින් ගෞරවය දිනාගෙන තිබුණි. 2003-2004 වසරවල බටහිර කලාපයේ අණදෙන නිලධාරියා සහ ඊට පසු රාජකීය නේපාල හමුදාවේ ප්‍රධානියා වශයෙන් විප්ලවීය බලවේගයන් ඔහුගේ හමුදාව කඩා බිඳ දැමීම තුල වඩාත් දුෂ්කර සටන් දැක තිබුණි. ගම්මාන සහ ගෙවල් හිතුවක්කාර ලෙස විනාශ කර දැමීම, වධ හිංසා කිරීම, ස්ත්‍රී දූෂණය, හමුදාවේ ප්‍රධාන මිනීමරු ක්‍රියාවලිය ඔහුද රඟපා තිබුණි. 2006 නොවැම්බර්වල යුද්ධය අවසාන කරන්ට ගෙනා අවබෝධාත්මක සාම ගිවිසුමට පෙර සහ 2006 අප්‍රේල් සටන් විරාමයට පසු මාස කීපයක් නේපාල රාජකීය හමුදාවේ ප්‍රධානියා විය. නේපාල රාජකීය පවුලේ ළමයෙක් වශයෙන් පිලිගැනීමෙන් පසු ඔහු මාළිගාව තුල වැඩුණේය. රාජාණ්ඩුවේ සැක නොකල හැකි නිෂ්පාදනයක් වූ සමූහාණ්ඩුවක් වූ පමණකින් නේපාලයට සමාජ ස්ථාවරත්වය ආරක්ෂා කළ නොහැකි බව විදෙස් බලවතුන් සහ නේපාලයේ පාලක පංතීන්, දේශපාලන පක්ෂ අතර ඒකමතිකත්වයක් ඇතිවනවිට, ඉහල කටයුතු වලට, ඉතා ඉහළ රාජ පාක්ෂික භාවයක් ඔහු ප්‍රදර්ශනය කළේය. මේ ආකාරයෙන් සන්නද්ධ බලවේගයන්ගේ දේශපාලන සහ සමාජ පැවැත්මේ නිමිත්ත ඔහු විය.

රාජාණ්ඩුව නිෂේධනයට විරුද්ධ නොවූ අතර දැන් නේපාල හමුදාවේ සුළු ඉල්ලීමක් කළ විට හෝ ඉතා සුළු වෙනස් වීමක් වූ දෙයට ඔහු විරුද්ධව සිට ඇත. 2006 අවබෝධතා සාම ගිවිසුමට අනුව මහජන විමුක්ති හමුදාව හා ආරක්ෂක හමුදාව සම්පූර්ණ වනසේ එකතු කළ යුතුව තිබුණි. රතු හමුදාවේ පැවැතීම නැතිවියාම මෙය අදහස් කරයි. තර්කය (ගැටුම) එය සම්පූර්ණයෙන්ම විරුද්ධවෙන ආකාරයයි. තාවකාලිකව මහජන විමුක්ති හමුදාවේ 19,000 ක් දෙනා එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ කඳවුරුවල ගතකර ඇත. ඔවුන්ගේ ප්‍රධාන ආයුධ එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ යතුරු දමා ඇත.

මහජන විමුක්ති හමුදාවේ අණදෙන්නන් ඔවුන්ගේ නිළධාරි මට්ටමට බඳවා ගන්නටත් සම්පූර්ණයෙන්ම නේපාල හමුදාවට මහජන හමුදාවේ ඒකක එකතු කරනවාටත් කටාවාල් විරුද්ධවී ඇත. ඔහුගේ හමුදාව අඩුවෙන් දේශපාලනය වී ඇත්නම් නේපාල හමුදාවට ''දේශපාලනික'' මහජන විමුක්ති හමුදාවේ සාමාජිකයන්ට ඉඩ නොදිය යුතු බව ඔහු තරයේ ප්‍රකාශ කර ඇත. ප්‍රතිඵලයක් වශයෙන් හමුදාවන් දෙක ''එකතුවීම'' නොවැදගත්ව ඇත.

මහජන විමුක්ති හමුදාවේ සාමාජිකයන්ට එහි නිලයන්ට ඉඩහැරීම වෙනුවට නේපාල හමුදාවටම හටයින් බඳවා ගෙන ඇත. බඳවා ගැනීමේ කඳවුරු තුනක් පවත්වා ඇත. සෑම තැනම මාධ්‍යවලින් ප්‍රචාරය කර ඇත. මෑතදී 2008 අවසානයේ සහ 2009 මුලදී ප්‍රසිද්ධ රැලි පවත්වා ඇත. අවබෝධාත්මක සාම ගිවිසුමේ ලිපිය සහ හරය සෑම කණ්ඩායමක්ම කඩකිරීම මගින් සාම වැඩ පිලිවෙලේ ප්‍රධානියා වන එක්සත් ජාතීන්ගේ නියෝජිතයා වන ඉයන් මාටින් (Ian Martin) කිසියම් බලය වැඩි කිරීමක් බව ප්‍රකාශකර ඇත. වැඩ පිලිවෙල හොයා ගෙන ඇති මේ කාරණය පැමිණිලි කරගන්ටත් ඔවුනොවුන්ව පාලනය කරන්ටත් විදේශීය බලවේගයන් මෙතෙක් කිසිවක් කර නැත. ඒ වෙනුවට සේනාධිපතිය විදේශීය තානාපතිවරු සමඟ රැස්වීම් පවත්වා ඇත. ඔහු රජයේ නියම නායකයා වශයෙන් ඔහුම විදේශීය තානාපතිවරු මුණගැසී ඇත.(2009 පෙබරවාරි 19, ''නේපාල සාම වැඩපිලිවෙල ඇන හිටීම'' ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම 2008 දෙසැම්බර් මස 23 පුවත් නිවේදනය උපුටා දක්වා ඇත.)

මේ අතර ප්‍රචණ්ඩාගේ ආණ්ඩුව හමුදා අණදෙන්නා පිළිබඳව කිසිවක් කියන්ට ඉඩ දී නැත. නියෝගයකින් පාලනය කරන ස්වයංව විශ්‍රාම යන වයසට පැමිණ සිටි ජනරාල්වරු අට දෙනෙක්ගේ කාලය දිගු කිරීම ආණ්ඩුව ප්‍රතික්ෂේප කළ විට, මේ අවුරුද්දේ මුලදී වර්තමාන අර්බුදය මුලස්ථානයට එක්ව පටන් ගත්තෝය. ඔහුට වඩාත් පක්ෂපාතීව සිටීමත් එවිට ඇති කරන ඉඟියකින් රජතුමා බොහෝ විට නිල කාලය දික් කර ඇත. කටාවාල් කිසිම ආකාරයකින් ජෙනරාල්වරයෙකු නැවත පත් කිරීමත්, ආරක්ෂක ඇමැතිවරයාවත් ප්‍රතික්ෂේප කළේය. සුපිරි උසාවියද ආරක්ෂක ඇමැතිවරයාගේ තීරණය තාවකාලිකව අත් හිටෙව්වේය.

අප්‍රේල් මාසය මැදදී කාරණා තුනක් පිළිබඳව, නියෝගයන් කඩකිරීමට ''නිදහස'' සඳහා ආණ්ඩුව විධිමත්ව කටාවාල්ව විමසීය. රියදුරන් බඳවා ගැනීම, විශ්‍රාමලත් ජෙනරාල්වරු කුපිත කරවන්ට යෝජනාවන්ගෙන් ඉඟි කරවූ මහජන විමුක්ති හමුදා සාමාජිකයින් ඔවුන්ගේ පැරණි සතුරන් සෑදූ කණ්ඩායම්වලට විරුද්ධව මලල ක්‍රීඩා තරඟයක් ක්‍රීඩා කිරීමට ප්‍රතික්ෂේප කළ නිසාත් හමුදාවේ සහ පොලීසියේ විවිධ අංශ අතර ජාතික ක්‍රීඩාවලින් හමුදාවේ ඉවත්වීම, ප්‍රචණ්ඩාගේ ආණ්ඩුව ඔහුව පහ කිරීමට ඡන්දය දී සති දෙකකට පසු සේනාධිපති පිලිතුරු පැය විසි හතරක් තුළ දෙනු ලැබීය

## සේනාධිපති සහ ජාත්‍යන්තර ප්‍රජාව

සේනාධිපතිගේ බලවත් විරෝධය, විශේෂ චරිත ලක්ෂණයක් හෝ රාජකීය පුහුණුවීමෙන් ඔහුගේ ජීවිතයට නෂ්ටවූ සරල ලක්ෂණයක් නොවේ. මෙය ඔහුගේ පුද්ගලික මනෝභාවයක් නොව, බලවත් අධිපතීන් විසින් දැඩිව සිටින්නට ඔහුට කියා ඇත.

නේපාල හමුදාවේ ''ශක්තිමත්ම ජාත්‍යන්තර සම්බන්ධතාවය ඉන්දියාව බව'' තොරතුරු පිළිබඳව හොඳින් දත් සිටි ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම පෙබරවාරි 19 වාර්තාවේ ලියා ඇත. ''හැකිතාක් එහි කාර්යයන්ට එකතුවීම පුරා එහි අඩංගු වැඩිපුරම කොටස් සංස්කෘතිය සහ පවතින ව්‍යුහයට තර්ජනය කරන්ට යම් පියවරවල් පෙනී සිටින බවත්, විරෝධය පාන්ට යමක් මත රැඳී සිටිමට හැකියාව ඇත. '' බ්‍රසල්ස් පදනම් වූ ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම (ICG) ඔවුන්ව විශ්වාස කරනු ලබන අනිකුත් මිනිසුන්ව ඔවුන්ගේ උපදේශකයන්ට රාජ්‍යයේ පෙර බටහිර මූලස්ථානය කරගෙන තිබුණ සංවිධානය උපදෙස් දෙමින් සිටී. ''ඉන්දියාව මත රඳා පවතිනු'' ඔවුන් කියන විට අධිරාජ්‍යවාදී බලවතුන් රැඳී පවතින දෙය ඉන්දියානු ව්‍යාප්තවාදයේ කටයුතු බව මෙය හරියටම අදහස් කරන දෙයයි.

නමුත් ප්‍රධාන අධිරාජ්‍යවාදී රාජ්‍යයන් සහ අනිකුත් බලවතුන් එයට වඩා බොහෝ දේකර ඇත. ඔවුන් ඍජුවම දේශපාලන මට්ටමින්ම මැදිහත් වී ඇත.

දේශපාලන අර්බුදයේ කාලය අතරතුරදී එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) සේනාධිපති යුද්ධය අවුලවන බවට සහ කුදෙතාවේ හවුලකරුවන් දෙගිඩියාවෙන් සිටින බවට ප්‍රකාශ කරන විට එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, චීනය සහ ජපානය ඇතුළු රටවල් අටක නියෝජිතයන් සාමූහික ප්‍රකාශය ගැන සාකච්ඡා කරන්ට අගමැතිගේ නිවාසයට ළඟා විය. රැස්වීම මුදල් අමාත්‍යය බාබුරාම් භට්රායිද ඇතිව පවත්වමින් තිබුණි. සාම වැඩපිළිවෙලට අවහිරකරනවා යැයි කියමින් ආණ්ඩුව හමුදා ප්‍රධානියා නෙරපීමට කළ ක්‍රියාවට ජාත්‍යන්තර ප්‍රජාව අමනාපය පල කර ඇත. (Nepalnews.com, අප්‍රේල් 12) මගින් පාලනය වන ''සාම වැඩ පිළිවෙලට අවහිර කරන'' හමුදාව රට වැසියන් පාලනය කිරීම තහවුරු කරන්නේ කොහොමද? ''ජාත්‍යන්තර ප්‍රජාව'' නේපාලයේ ප්‍රතිගාමීන් වගේ ඒවා ඔවුන්ගේ උවමනාකම්වලට සේවය කරන්ට දැඩි විශ්වාසයත්, ජනතාවගේ අත්වලින් සන්නද්ධ බලහත්කාරයේ අදහසේ ඒකාධිකාරය සඳහා අදහස් කරන මෙය සැබෑවටම උපක්‍රමයක් නොවේද? ඇත්තවශයෙන්ම බලාපොරොත්තු වන පරිදි ක්‍රියාකරන්නේ නැතිනම් මෙය එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂයට (මාඕවාදී) විරුද්ධව බලහත්කාරයෙන් බිය ගැන්වීම නොවේද?

වඩාත්ම නොසැඟවුණු මැර ශෛලියට පැවැත්වූ ''සාමූහික සාකච්ඡාවට'' අනුව යමින් ඉන්දියානු තානාපති යළි උපදෙස් සඳහා ආපසු නව දිල්ලියට විත් ''ආණ්ඩුව හමුදා ප්‍රධානියා නෙරපා දමන්නේ නම් එදවස තුල වර්තමාන මාඕවාදී නායකත්වය දෙන ඒකාබද්ධවීම පෙරලා දමන බව දැනුම් දුන්නේය. ඉන්දීය විදේශ කටයුතු ඇමැති ප්‍රනාබ් මුඛර්ජි (Pranab Mukherjee) එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂයේ සභාපති ජාලා නාත් කනාල්ට (Jhala Nath Khanal) දුරකථනයෙන් කථාකර හමුදා ප්‍රධානියා නෙරපා දමන මාඕවාදීන්ගේ සැලැස්මට සහයෝගය නොදෙන ලෙසට පැවසූ බව වාර්තා පවසයි. (Nepalnews.com, අප්‍රේල් 25) පසුව එක්සත් මාක්ස්-ලෙනින්වාදී නායකයා එහි නියෝග වැරදි අදහස් සහිත බවත්, හමුදා ප්‍රධානියා නෙරපා දැමීම අසන්ට අයිතියක් සිවිල් ආණ්ඩුවට තිබෙන බවටත් ප්‍රකාශ කළේය. (Nepalnews.com, මැයි 1)

එක්සත් ජනපදය ඉතා පැහැදිලි සංඥාවක් කළේය. නේපාලයේ දේශපාලන අර්බුදය ක්‍රමයෙන් ඉහළට ළඟාවෙද්දී අප්‍රේල් 30 එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව, මහජන යුද්ධයේ අවසානය සහ මාඕවාදීන්ගේ මැතිවරණ ජයග්‍රහණය නොසලකා, එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ත්‍රස්තවාදී සංවිධානවල නිල ලැයිස්තුවේ තවමත් ඉතිරි වෙන බව පැහැදිලි කරන ප්‍රකාශනයක් නිකුත් කළේය.

කාරණය ලෙස පක්ෂයේ කොමියුනිස්ට් තරුණ ලීගයේ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව චෝදනා කර ඇත. ඇෆ්ඝන් යුද්ධය තුල සිදු කෙරෙන මානව අපරාධ, සහ එක්සත් ජාතීන්ට සහ ජාත්‍යන්තර ප්‍රජාවට අනුව නීති විරෝධීව කෙරෙන ඉරාක යුද්ධයේ එක්සත් ජනපදය යෙදී සිටී. එහෙයින් යම් කෙනෙකුගේ සුළු බලහත්කාරකම් වලට දෝෂාරෝපණය සහ හෙලා දැකීම ඉතා වැරදිය. තවදුරටත් ජෙනරාල් කටාවාල්ගේ හමුදාවේ මහා අපරාධවලට විරෝධය පෑවේ කවදාද? නමුත් ජාත්‍යන්තර දෝෂාරෝපණය පෙළඹවීම නැතිව, එක්සත් මාක්ස් ලෙනින්වාදීන්ගේ තරුණ සංවිධානයට විරුද්ධව එක සමාන මට්ටමේ තිබෙන සාමාන්‍ය චෝදනා බව අඩුතරමින් වත් දැනුම් දිය යුතුය. කාරණය සියලුම ''ලොක්කන්ගේ ලොක්කා'' වන ''ජාත්‍යන්තර ප්‍රජාවේ'' ප්‍රධාන අණදෙන මැරයා වන ඔබාමා ආණ්ඩුව කථා කර තිබීමයි.

පරිවර්තනය
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
අංක 01

http:/ / slmarxist.yolasite.com
slmarxist@ymail.com